{සියලුම හිමිකම ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| | | |
|---|---|---|
| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 3 යි 10 |

විෂයය :- චිත්‍ර කලාව - I
පාසලේ නම :- ...........................................
ඇතුළත්වීමේ අංකය :- ...........................................

උපදෙස්
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.

**I කොටස**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

**II කොටස**

අනු කොටස් තුනකින් සමන්විතය.

'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

- I කොටස හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

---

I කොටස

- ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

01. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ලෙන් සිතුවම් පළමු වරට අනාවරණය කරන ලද්දේ,

1.පී.ඊ.පී. දැරණියගල විසින්ය.
2. ජෝන් ස්ටීල් විසින්ය.
3.පී.එෆ්.ආර්.බ්‍රවුනින් විසින්ය.
4. සෙලිග්මාන් විසින්ය.
5.එච්.සී.පී. බෙල් විසින්ය.

(..................)

02. අනුරාධපුර යුගයට අයත් ලෙන් සිතුවම් තුළින් සම්භාව්‍ය ස්වාභාවිකවදී ශෛලීය ලක්ෂණ පිළිබිඹු කරන බව පිළිගත් මතයකි.

**සම්භාව්‍ය ස්වාභාවිකවාදී ශෛලීය යනු,**

1. ඒක වාර්ණික වර්ණ මාලාවකට යටත්ව ස්වාභාවය මූලාශ්‍රය කර ගනිමින් රූපක ගොඩනගා ගැනීමේ සම්ප්‍රදායයි.
2. බහුවාර්ණික වර්ණ මාලාවකට යටත්ව ස්වාභාවය මූලාශ්‍රය කර ගනිමින් රූපක ගොඩනගා ගැනීමේ සම්ප්‍රදායයි.
3. වර්ණ, රේඛා, හැඩ විවිධත්වයකට අනුව ගොඩනගාගැනීමෙන් රූපක ගොඩනගා ගැනීමේ සම්ප්‍රදායයි.
4. වර්ණ පිළිබඳ සැලකිල්ලක යොමු නොකර ගනිමින් ස්වාභාවය මූලාශ්‍රය කර ගනිමින් රූපක ගොඩනගා ගැනීමේ සම්ප්‍රදායයි.
5. එක් වාර්ණික වර්ණ මාලාවකට යටත්ව රේඛා, හැඩ පිළිබද අවධානය යොමු නොකරමින් සිතුවම් කිරීමේ සම්ප්‍රදායයි. (.................)

3. ඉහළ පුරා ශිලා යුගය ලෙස දක්වන කාලවකවානු තුළ හමුවන යුරෝපිය ප්‍රාග් ඓතිහාසික සිතුවම් හා මූර්ති හමුවන රටවල් වන්නේ

    1. ඉන්දියාව,ලංකාව හා ජපානයයි
    2. ප්‍රංශය,ස්පාඤ්ඤය, උතුර හා දකුණු ඇමරිකාවයි
    3. අප්‍රිකාව, චීනය හා මැලේසියාවයි
    4. ඉන්දියාව, චීනය හා බුරුමයයි.
    5. ලංකාව, සිංගප්පුරුව හා ඉන්දියාවයි.

(..................)

4. ඊජිප්තුව (මිසරය) නයිල් ගංගාවේ දායාදයක් ලෙස ප්‍රකාශ කළ ඉතිහාසඥයා වන්නේ

1. හෙරඩෝටස් ය　　2. ප්‍රැක්සි ටෙලස්ය
3 රා මේසස් ය　　4 අමෙන් හොටෙප් ය
5 නර්මෙර්ය

(..................)

5. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ උසස් ශිල්පිය තාක්ෂණික කුසලතාවයකින් යුතු කලා නිර්මාණයක් වන්නේ

    1. පූජක/පාලක රූපයයි
    2. රතු වැලි ගලින් කළ කවන්ද මානව රූපයයි
    3. අළු පැහැති වැලි ගලින් කළ කවන්ද මානව රූපයයි
    4. බ්‍රාහ්මණී ගව මූර්තියයි
    5. නළගන රූපයයි

(..................)

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර අංක 1 සිට 6 තෙක් අංක කර ඇති පහත සදහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න


1


2


3


4


5


6

6. දඹුලු ලෙන් විහාරයේ දේවරාජ ලෙනේ දක්නට ඇති සිතුවම වන්නේ

    1. අංක 1 රූපයෙන් දැක්වෙන සිතුවමයි
    2. අංක 2 රූපයෙන් දැක්වෙන සිතුවමයි
    3. අංක 3 රූපයෙන් දැක්වෙන සිතුවමයි
    4. අංක 4 රූපයෙන් දැක්වෙන සිතුවමයි
    5. අංක 5 රූපයෙන් දැක්වෙන සිතුවමයි

(..................)

7. දකුණු සම්ප්‍රදායට අයත් ආවේණික ලක්ෂණ සහිත සිතුවම් වන්නේ
   1. අංක 1,2,4 යන සිතුවමය
   2. අංක 3,4,5 යන සිතුවමය
   3. අංක 1,3,5 යන සිතුවමය
   4. අංක 1,3,4,6 යන සිතුවමය
   5. අංක 2,4,5,6 යන සිතුවමය

(..................)

8. දකුණු සම්ප්‍රදායේ චිත්‍ර කලා ශෛලියයට නැකම් කියන මුල් කිරිගල විහාරයේ ඉතා සුප්‍රසිද්ධ සිතුවමක් වන්නේ
   1. අංක 4 රූපයේ දැක්වෙන සිතුවමයි
   2. අංක 6 රූපයේ දැක්වෙන සිතුවමයි
   3. අංක 3 රූපයේ දැක්වෙන සිතුවමයි
   4. අංක 1 රූපයේ දැක්වෙන සිතුවමයි
   5. අංක 2 රූපයේ දැක්වෙන සිතුවමයි

(..................)

9. පහතරට කතළුව විහාරස්ථානයෙන් හමුවන සිතුවම් වන්නේ
   1. අංක 1,2,4 යන සිතුවමය
   2. අංක 2,4,6 යන සිතුවම්ය
   3. අංක 1,3,4 යන සිතුවම්ය
   4. අංක 3,4,5 යන සිතුවම්ය
   5. අංක 4,5,6 යන සිතුවම්ය

(..................)

10. මධ්‍යම නුවර ශෛලිය ලක්ෂණ හොඳින් නිරූපණය කරන මැදවල විහාරස්ථානයේ සිතුවමක් වන්නේ
   1. අංක 1 රූපයයි
   2. අංක 2 රූපයයි
   3. අංක 3 රූපයයි
   4. අංක 4 රූපයයි
   5. අංක 5 රූපයයි

(..................)

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට යෝග්‍ය පිළිතුර පහත සඳහන් ABCDE ලෙස නම් කර ඇති රූපසටහන් ඇසුරින් තෝරන්න



A B C D E

11. නිශ්චිත පුද්ගලයෙක් නිශ්චිත සිදුවීමක් හා නිශ්චිත කාලවකවානුවක් නිවැරදිව හඳුනාගත හැකි පළමුවැනි ඓතිහාසික මිසර/ඊජිප්තු දෘෂ්‍ය කලා කෘතිය A අක්ෂරයෙන් දැක්වේ. එම නිර්මාණය
   1. හෙසිරා නම් වේ
   2. ඇක්නෙටන් නම් වේ

3. නාමර් නම් වේ
4. ස්ක්‍රයිබ් නම් වේ
5. ස්පින්ක්ස් නම් වේ

(..................)

12. ප්‍රමාණයෙන් මීටර් 15 ක් පමණ උසින් හා මීටර් 30 ක් පමණ දුරකින් යුත් පාෂාණ කන්දක මානව රූප හා සත්ව රූප අන්තර්ගත කරමින් සිත්ගන්නා සුළු ආකාරයට පල්ලව කලාකරුවා විසින් කළ කැටයමක් "B" රූප සටහනින් දැක්වේ. මෙහි අර්ථකථනය වී ඇත්තේ
   1. ආකාශ ගංගාවරෝහණයයි
   2. අර්ජුනගේ තපසයි
   3. ආකාශ ගංගාවරෝහණය ලෙස හෝ අර්ජුනගේ තපස ලෙසයි
   4. මෙම අර්ථකථන දෙකම භාරතීය මූලාශ්‍ර පිළිනොගනී
   5. මෙම අර්ථකථන මුළුමනින්ම අසත්‍යයයි

(..................)

13. ක්‍රි.පූ 550 - 530 අතර කාලයේ ඇම්පෝරා බඳුණ ග්‍රීක නිර්මාණය අතර හමුවේ C අක්ෂරයෙන් දැක්වෙන ඇම්පෝරා බඳුන මත නිර්මාණය කර ඇත්තේ
   1. අයස් සහ ඇකිලිස් යන අය දාදු ක්‍රීඩාවේ යෙදෙන අයුරුයි
   2. හේවායින් දෙදෙනකු වැටුණු මුදලක් සොයන අයුරුයි
   3. අයස් සහ ඇකිලිස් යම් ක්‍රීඩාවක යෙදී සිටින අයුරුයි
   4. පාලකයෙක් සහ මුරහටයෙක් යම් සාකච්ඡාවක නිරතව සිටින අයුරුයි
   5. අයස් සහ ඇකිලිස් වැටුණු මුදලක් සොයන අයුරුයි

(..................)

14. පාෂාණ ඇත්දත් කැටයම් සේම දැව කැටයම් සඳහාද දේශීය කලාකරුවා සුවිශේෂී බවක් දක්වා ඇත. D රූප සටහනින් දැක්වෙන්නේ
   1. පාෂාණ වලින් කළ කැටයමකි
   2. ඇත්දළ මාධ්‍යයෙන් කළ මල්ලව පොරයකි
   3. ලෝහ මාධ්‍යයෙන් කළ මල්ලව පොරයකි
   4. දැව මාධ්‍යයෙන් කළ මල්ලව පොරයකි
   5. මැටි මාධ්‍යයෙන් කළ මල්ලව පොරයකි

(..................)

15. "E" අක්ෂරයෙන් දැක්වෙන්නේ කුෂාණ වංශික ගංධාර කලාකරුවන් විසින් නිර්මාණය කළ බුදුරුව මනාවරුපිව දැක්වෙන රන් කාසියයි. මෙම කාසියේ අනෙක් පස
   1. ගන්ධාර කලාකරුවාගේ රූපය දැක්වේ
   2. කුෂාණ වංශික පාලකයෙකුගේ රූපය දැක්වේ
   3. ගන්ධාරයේ විසූ පූජකවරයෙකුගේ රූපය දැක්වේ
   4. කුෂාණ පූජකවරයෙකුගේ රූපය දැක්වේ.
   5. කුෂාණ වාංශික කනිෂ්ක රජුගේ රූපයක් දැක්වේ

(..................)

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර FGHIJ ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න

16.



F G H I J

| | |
|---|---|
| 1.රෆායල් සන්සියෝය | 2.සැන්ඩෝ බොටිෂෙලිය |
| 3.මයිකල් අංජිලෝය | 4.ලියනාඩෝ ඩාවිංචිය |
| 5.වෙරෝචියෝය | |

(..................)

17. මධ්‍යම පාන්තිකයන්ගේ විනෝදකාමී එලිමහන් ජීවිත උපස්ථිතිවාදීන් විසින් චිත්‍රයට නගද්දී කාන්තාව වටා ගොනුවී ඇති ගෘහස්ථ ජීවිතය චිත්‍රයට නැගූ චිත්‍ර ශිල්පියකුගේ නිර්මාණයක් ''G" අක්ෂරයෙන් දක්වා ඇත. මෙම චිත්‍රය නිර්මාණය කරන ලද්දේ

| | |
|---|---|
| 1.එඩ්ගා ඩෙගාය | 2.වින්සන්ට් වැන්ගෝය |
| 3.මේරි කසාට්ය | 4.ෆ්‍රිඩා කාලෝය |
| 5.අම්රිතා ෂර්ගිල්ය | |

(..................)

18. බටහිර ශාස්ත්‍රාලයීය ස්භාවිකවාදී ශෛලිය ලක්ෂණ ආභාෂය කර ගනිමින් 20 වන සියවන මුල් අවදියේ ලාංකිය බෞද්ධ චිත්‍ර කලාවට නව පුනරුදයක් ලබා දුන් ශිල්පයකුගේ නිර්මාණයක් " H" අක්ෂරයෙන් දැක්වේ. එහි නිර්මාණශිල්පියා වන්නේ

| | |
|---|---|
| 1. ඇම් සාර්ලිස්ය | 2. සොලියස් මැන්ඩිස්ය |
| 3. ජෝජ් කීට්ය | 4. මුදලිඳු අමරසේකරය |
| 5. සෝමබන්දු විද්‍යාපතිය | |

(..................)

19. යුරෝපිය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදයට එරෙහිව, එයට ප්‍රතික්‍රියාවක් ලෙස ක්‍රියාත්මක වූ ඉන්දිය චිත්‍ර ශිල්පියකුගේ නිර්මාණ කෘතියක් " I" අක්ෂරයෙන් දැක්වේ. එම චිත්‍රයේ නිර්මාණ ශිල්පියා වන්නේ

| | |
|---|---|
| 1. අම්රිතා ෂර්ගිල්ය | 2. මේරි කාසාට්ය |
| 3. රාජා රවි වර්මාය | 4. නන්දලාල් බෝෂ්ය |
| 5. ජෙමිනි රෝයිය | |

(..................)

20. ශ්‍රී ලංකේය නූතන චිත්‍ර කලාවේ වඩාත් ජනප්‍රියතම ශිල්පියාගේ නිර්මාණයක් " J " අක්ෂරයෙන් දක්වා ඇත. මෙම සිතුවම නිර්මාණය කළ ජත්‍යන්තර කිර්තියට පත් ශිල්පියා වන්නේ

| | |
|---|---|
| 1.අයිවන් පීරිස්ය | 2.ජස්ටින් දැරණියගලය |
| 3.ඩබ්.ජේ.ජී. බිලිංය | 4.ජෝජ් කිට්ය |
| 5.රිචඩ් ගේබ්‍රියල්ය | |

(..................)

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන පිළිතුර **L,M,N,O,P** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරින් තොරන්න


L


M


N


O


P

21. " L" අක්ෂරයෙන් දැක්වෙන්නේ

1. මහාරාජ ලීලාවෙන් වාඩි වී සිටින යුවලකි
2. ලෝකඩ ඝනවස්තු ක්‍රමයට නිර්මාණය කළ මූර්තියකි
3. හින්දු ආභාෂය මත නිර්මිත ශිව පාර්වතී මූර්තියකි
4. අනුරාධපුර යුගයේ නිර්මිත ලෝකඩ මූර්තියකි
5. හෙන්රි මුවර් විසින් නිර්මාණය කළ රජ පවුල නම් මූර්තියයි

(..................)

22. " M" අක්ෂරයෙන් දැක්වෙන්නේ

1. පොළොන්නරුව අංක 02 ශිව දේවාලයෙන් හමුවූ මූර්තියකි
2. ක්‍රි.ව 12 වැනි සියවසට අයත් ලෝකඩ මාධ්‍යයෙන් කළ නිර්මාණයකි
3. ශිව දෙවියන් කෙරේ දැක් වූ අසාමාන්‍ය භක්තිය නිසා නාරි සෞන්දර්ය අභිමිකරගත් කාරයික්කාර් අම්මයාර් නම් වූ ලෝකඩ මූර්තියකි.
4. සුවිශේෂි කලා ලක්ෂණ පෙන්වන නිර්මාණ කෘතියකි.
5. ලෝකඩ මාධ්‍යයෙන් කළ නළගනකි. ශිව භක්තිය නිසා කුෂ හා විකෘති වූ කාන්තාවකි

(..................)

23. ඔගස්තේ රොඩැන් නම් ප්‍රංශ ජාතික මූර්ති ශිල්පියා විසින් නිර්මාණය කළ මූර්තිය " N"අක්ෂරයෙන් පෙන්වා දී ඇත. මෙම මූර්තිය නම්කර ඇත්තේ

1.රටක පුරවැසියෝ ලෙසයි
2.දුක්බර පුරවැසියන් ලෙසයි
3.හඬා වැළපෙන ජනතාව ලෙසයි
4.චින්තකයන් ලෙසයි
5.කැලෙස් හි පුරවැසියෝ ලෙසයි

(..................)

24. කිරි ගරුඬ මාධ්‍යයෙන් නිර්මිත මෝසස් නම් නිර්මාණය " O" අක්ෂරයෙන් දැක්වේ. මෙයින් නිරූපණය වන්නේ

1. කාය බල ශක්තිය සහිත මහලු මිනිසෙකි
2. නිවැරදි කාය ව්‍යුහය ලක්ෂණ අනුව මූර්තිමත් කළ රූපයකි
3. ආගමික වස්තු විෂයන් තේමා කරගෙන වයෝවෘද්ධ මුහුණක් හා කාය බල ශක්තිය නිරූපණය කරන පුද්ගලයෙකි.
4. ආගමික තේමාවකට අනුව නිර්මාණය කළ මෝසස් ගේ දකුණු අතින් දස පනත සිහිගන්වන ගල් පුවරු දෙකක් අල්ලාගෙන සිටි
5. මෙම මූර්තිය තුළින් මයිකල් අංජලෝගේ නිර්මාණ හැකියාව ප්‍රකාශ කරයි

(..................)

25. තමාට මහා ඇලෙක්සැන්ඩර්ගේ රූපයට සමාන රුවක් ඇතැයි ප්‍රකාශ කළ රජකුගේ රුවක් " P" අක්ෂරයෙන් දැක්වේ මෙම රජු වන්නේ


1. ජුලියස් සීසර්ය
2. ඔගස්ටස්ය
3. කැරකැලය
4. ට්‍රැජන්ය
5. කොන්ස්ටන්ටයින්ය


(..................)

- ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර Q,R,S,T,U ලෙස නම් කර ඇති රූප සටහන් උපයෝගි කරගෙන තෝරන්න


Q


R


S


T


U

26. පීට් මොන්ඩ්‍රියන් ප්‍රංශයේදී විශ්ලේෂණාත්මක ඝණිකවාදයේ බලපෑම් මත සිය පූර්ව ප්‍රකාශනවාදී මාවත සම්පූර්ණයෙන්ම වෙනස් කරමින් පූර්ණ වශයෙන් ව්‍යුක්ත ශෛලියක් ගොඩනැගීය. ඊට අනුව නව ප්ලාස්ටියවාදය ගොඩනැගිය. මෙම ශෛලිය " De Style" නම් විය. මෙම සිතුවම් අතරින් මොන්ඩ්‍රියන්ගේ සිතුවම දැක්වෙන ඉංග්‍රිසි අක්ෂරය වන්නේ

1 Qය 2 Tය (..................)
3 Rය 4 Uය
5 Sය

27. අධි තාත්විකවාදී චිත්‍ර ශිල්පියෙකු වූ සැල්වඩෝ ඩාලිගේ නිර්මාණ කෘතිය දැක්වෙන ඉංග්‍රිසි අක්ෂරය වන්නේ

1 Qය
4 Rය
2 Sය
5 Tය
3 Uය
(..................)

28. රෝම සිතුවම් අතර ඉතා විශිෂ්ඨ නිර්මාණ කිහිපයක් පොම්පේ විලා හෙවත් විලා විලා මිස්ටරින් නමින් හදුන්වන ගොඩනැගිල්ලෙන් සොයා ගැනේ මේ අතර ඇති රෝම සිතුවම් දැක්වෙන ඉංග්‍රිසි අක්ෂරය වන්නේ

1 Qය 2 Sය 3 Uය
4 Rය 5 Tය
(..................)

29. නිල් යුගය ,රෝස යුගය සහ ඝණිකවාදී යුගය ලෙස පිකාසෝගේ චිත්‍ර නිර්මාණ අවදි කිහිපයක් වර්ගීකරණය කරයි. 1907 දී පිකාසෝ ඝණිකවාදයට ප්‍රවේශ වීමෙහිලා අඳින ලද සිතුවම දැක්වෙන ඉංග්‍රිසි අක්ෂරය වන්නේ


1 Qය 3 Uය 5 Tය
2 Sය 4 Rය

(..................)

30. 20 වන සියවස නූතන චිත්‍ර කලා ප්‍රවේශය සදහා පුරෝගාමීත්වයක් ගන්නා පෝල් සෙසාන්ගේ නිර්මාණ කෘතිය දැක්වෙන්නේ,

1 Q අක්ෂරයෙන් ය 2 Rඅක්ෂරයෙන් ය 3 Sඅක්ෂරයෙන් ය
4Tඅක්ෂරයෙන් ය 5 U අක්ෂරයෙන් ය (..................)

* ප්‍රශ්න 31 සිට 35 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න



31. මෙහි දැක්වෙන ග්‍රීක වාස්තු විද්‍යා නිර්මාණය
    1. ඉපැරණි මහල් ගොඩනැගිල්ලක ශේෂ වූ කොටසකි.
    2. ඩොරික් සම්ප්‍රදායේ කුලුනින් අලංකාර වූ පාතිනන් දෙවොලයි
    3. අයොනික් සම්ප්‍රදායේ කුලුණින් අලංකාර වූ මන්දිරයකි
    4. ක්‍රිස්තියානි දේව මන්දිරයකි.
    5. ඇතැන්ස් නුවර කොරින්තියන් කුළුනින් අලංකාර වූ ඔලිම්පියා දේවස්ථානයයි.

(..................)



32. තම රාජධානියේ අගනුවර වූ තිබ්ස්වල හමුවන 18 වන රාජවංශයට අයත් අමෙන්හොටෙප් රජු ක්‍රි.පූ 1350 දී ඉදිකිරීම ආරම්භ කළ අතර , 19 වන රජවංශයට අයත් II වන රමේසස් රජු වැඩ නිමකළ මෙම දේවස්ථානය
    1. කානැක් දේවාලයයි
    2. එඩ්ෆු දේවාලයයි
    3. පෙහොලි දේවාලයයි
    4. සිටි දේවාලයයි
    5. ලක්සෝර් දේවාලයයි

(..................)

33. මෙහි දැක්වෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රදේශයේ පිහිටි පර්වතයක් ආශ්‍රිතව නිර්මාණය කළ බලකොටුවකි. මෙම නිර්මාණය



    1. ක්‍රි.ව 1273 දී රාජ්‍යත්වයට පත් අයකුගේය.
    2. වන බුවනෙකබාහු රජු විසින් කරවූ යාපහුව රාජධානියයි.
    3. සිංහල බෝධි වංශයේ සුන්දර ගිරි පව්ව ලෙස නම් කරයි.
    4. නගර ප්‍රකාර, දිය අගල් හා විසිතුරු සෝපාන සහිතය.
    5. මේ සඳහා කළුගල් මාධ්‍ය තෝරාගෙන තිබේ.

(..................)



34. මෙම රූප සටහනින් දැක්වෙන්නේ
    1. කි.පූ. 4 සියවසේ ඉදිකළ මහායාන ලෙනකි
    2. අජන්තා ලෙන් අතර ඇති පැරණිම ලෙනකි
    3. අජන්තාවේ පැරණිම ලෙනක් වන අතර මෙය චෛත්‍යශාලාවකි
    4. අජන්තාවේ කැණීම් කළ විහාර මන්දිරයකි.
    5. ක්‍රි.ව 5 වන සියවසේ නිර්මිත චෛත්‍යය ශාලාවකි

(..................)

35. රෝමවරුන්ගේ යුධ ජයග්‍රහණ සහ විරුවන් සැමරීම් සඳහා ආරුක්කු නිර්මාණය දැකගත හැකිය. මෙම ආරුක්කුව



    1. ටයිටස් ආරුක්කුව නම් වේ.
    2. කොන්ස්ටන්ටයින් ආරුක්කුව නම් වේ.
    3. ට්‍රැජන් ආරුක්කුව නම් වේ.
    4. කොලෝසියම් ආරුක්කුව නම් වේ.
    5. යුද ජයග්‍රහණ ආරුක්කුව නම් වේ.

(..................)

- ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩා නිවැරදි ගැලපෙන පිළිතුර පහත චිත්‍රය ඇසුරින් තෝරන්න.



36. මෙම සිතුවම දැකගත හැක්කේ
    1. විද්‍යෝදය පිරිවෙන් විහාරයෙන්ය
    2. කැලණිය විහාරයෙන්ය
    3. බොරැල්ල ගෝතමී විහාරයෙන්ය
    4. කොළඹ මාලිගාකන්ද විහාරයෙන්ය
    5. බෙල්ලන්විල රජමහා විහාරයෙන්ය

(..................)

37. මෙම සිතුවමේ තේමාව වන්නේ
    1. මහා පිරිනිර්වාණයයි
    2. යකුන් පලවා හැරීමයි
    3. සම්බුද්ධත්වයට පත්වීමයි
    4. බුදුන් වහන්සේ මහියංගණයට වැඩම කිරීමයි
    5. මාර පරාජයයි

(..................)

38. මෙය නිර්මාණය කරන ලද්දේ
    1. බටහිර ශිල්පධර්ම ගුරුකොට ගත් ඇම් සාර්ලිස් විසින්ය.
    2. පෙරදිග කලා සම්ප්‍රදාය අනුගමනය කළ සෝලියස් මැන්දිස්ය.
    3. විහාර බිතු සිතුවම්කරණයේ විප්ලවකාරී මගක් ගත් සෝමබන්දු විද්‍යාපතිය.
    4. යුරෝපීය චිත්‍ර කලා ලක්ෂණ පෙරටු කරගත් රිචඩ් හෙන්රික්ස්ය.
    5. එල්.ටී.පී මංජු ශ්‍රී විසින්ය.

(..................)

39. ශිල්පියා මෙම සිතුවම නිර්මාණය සඳහා සාහිත්‍යයේ එන සාම්ප්‍රදායික රූපාර්ථ යොදාගෙන නැත. ඒ වෙනුවට වෙනත් රූපාර්ථ යොදාගෙන ඇත. සාම්ප්‍රදායික ශිල්පීන් මෙම තේමාවේදී නිරන්තරයෙන් ඇඳ දක්වන ලද සුවිශේෂී රූපාර්ථ දෙකක් වන්නේ
    1. බුදුන්ගේ කලබලකාරී බව හා මාර සේනාවේ අවි ආයුධයයි
    2. බුදුන්ගේ භූමි ස්පර්ශ මුද්‍රාව හා මහී කාන්තාවයි
    3. චතුරංගනී සේනාව සහ ඒ සමග පැමිණි මාර පුත්‍රයන්ය
    4. බුදුන්ගේ ඒකාංග කොට පෙරවූ චීවරය සහ ධර්මසානයයි
    5. බුදුන් හමුවට පැමිණි ශක්‍රයා හා මහීකාන්තාවයි

(..................)

40. මෙම සිතුවම වර්ණ ගැන්වීමේ දී වඩාත් හොඳින් කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
    1. බුදුන් වහන්සේට ප්‍රධාන තැනක් නොදී සෙසු චරිත සඳහා වඩා දීප්තිමත් වර්ණ භාවිතයට ගැනීමයි.
    2. ශෛල ගත ආකාරයට වර්ණ ගැන්වීමත්, ස්වභාවික අයුරින් වර්ණ ගැන්වීමත් මේ තුළ දැකගත හැකිය.
    3. වඩා උණුසුම් වර්ණ වන කහ පැහැයෙන් බුදුන්වහන්සේ වර්ණ ගැන්වීමත් මාර සේනාව උණුසුමින් අඩු වර්ණ වලින් දක්වමින් ඔවුන්ගේ බලය නිශේධ කිරීමත්ය.
    4. බුදුන්ට ඉහළින් ඇති බෝපත් කොළ පැහැයෙනව් දැක්වීමත්, බුදුන් වහන්සේ කහ පැහැයෙන් දැක්වීමත්ය.
    5. එකිනෙකට සමාන වර්ණ හා එකිනෙකට විරුද්ධ වර්ණ අර්ථාන්විත බවින් තොරව භාවිතා කිරීමය.

(..................)

## II කොටස

- මෙම කොටස අනු කොටස් තුනකින් සමන්විතය.
- අ කොටසින් ප්‍රශ්න දෙකක් හා ආ සහ ඉ යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

### අ කොටස

### චිත්‍ර කලාව ඇගයීම් හා රසාස්වාදය ශ්‍රී ලංකාව

**1.** අනුරාධපුර යුගයේ වාස්තු විද්‍යා නිර්මාණයක් ලෙස චෛත්‍ය නිර්මාණය සුවිශේෂී බවක් හිමිකර ගනි මේ සමගම බෞද්ධ කැටයම් හා මූර්ති කලාවේ ද පිබිදීමක් පැහැදිලිව දක්නට ලැබේ.

I. අනුරාධපුර යුගයේ චෛත්‍යය නිර්මාණයක් සමග ඒ අශ්‍රිත නිර්මාණය වූ සුවිශේෂී ගෘහ නිර්මාණ අංශ දෙකක් නම් කරන්නන (ලකුණු 2 යි)

II. අනුරාධපුර යුගයේ බෞද්ධ චෛත්‍යය නිර්මාණයේ ආරම්භය විකාශනය සැකෙවින් පැහැදිලි කරන්න (ලකුණු 5 යි)

III. අනුරාධපුර හා පොළොන්නරුව ස්ථූප ආශ්‍රිත නිර්මාණය වූ කලාත්මක ගෘහ නිර්මාණ අංශ දෙකක් පිළිබදව තුලනාත්මක ඇගයීමක් කරන්න (ලකුණු 8 යි)

**2.** 20 වන සියවස මැද භාගයේ දී ශ්‍රී ලංකීය චිත්‍ර ශිල්පීන් නූතනවාදී භාවිත ඉතා පැහැදිලිවත් තාර්කිකවත් ස්ථාවර ලෙසත් ස්ථාපිත කරගත් බව දක්නට ලැබේ

I. 45 කණ්ඩායමේ නූතනවාදී භාවිතය ප්‍රායෝගික කරගත් චිත්‍ර මූර්ති ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 2 යි)

II. 43 කණ්ඩායම නියෝජනය කළ නිහඬ ප්‍රකාශනවාදී චිත්‍ර කලා ප්‍රවණතාව ප්‍රකට කළ අයිවන් පීරිස් ශිල්පියා පිළිබදව උදාහරණ සහිතව කෙටි විස්තරයක් කරන්න (ලකුණු 5 යි)

III. 20 වන සියවස අග භාගයේ නූතන දෘෂ්‍ය කලාවේ පුරෝගාමී දමිළ ජාතික ශිල්පියෙක් ලෙස ඒ මාර්ක් හඳුනාගත හැකිය. ඔහු විසින් නිර්මාණය කරන ලද චිත්‍ර මූර්ති ඉතා ජනප්‍රියත්වයට පත්වී ඇත. ඒ මාර්ක්ගේ නිර්මාණ ඇසුරු කර ගනිමින් නූතන දෘෂ්‍යවාදී කලා ප්‍රවණයා පිළිබද ඇගැයීමක් කරන්නන (ලකුණු 8 යි)

**3.** ඉන්දිය සාහිත්‍ය ග්‍රන්තවල සදහන් වන ආකාරයට ක්‍රි.පූ. 6 සියවසේදි ද ලංකාවේ මහාවංශය දක්වන පරිදි ත්‍රි.පූ.3 මැද භාගයේ දී ද ඉන්දියාවෙන් ලංකාවෙන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය සිදුවී ඇති බව පිළිගත් මතයකි.

I. මහාවංශයේ දැක්වෙන පරිදි ලංකාවෙන් හමුවී ඇති ඉපැරණි බුද්ධ ප්‍රතිමා දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

II. අනුරාධපුර යුගයට අයත් පැරැණි බුද්ධ ප්‍රතිමාවල ලංකාවට අනන්‍ය වූ ලක්ෂණ මෙන්ම ඉන්දිය ප්‍රතිමා ලක්ෂණ ද ඔහුලව දැක්වේ. මේ පිළිබද උදාහරණ සහිතව කෙටි විස්තරයක් කරන්න (ලකුණු 5 යි)

III. පොළොන්නරු යුගය වන විට බුද්ධ ප්‍රතිමාව සංකල්පිය වශයෙනුත් ප්‍රතිමා ලක්ෂණ අනුවක් පැහැදිලි වෙනසකට බදුන් වී ඇත. මේ පිළිබද තුලනාත්මක විග්‍රහයක යෙදෙන්න (ලකුණු 8 යි)

## ආ කොටස
## චිත්‍ර කලාව ඇගයීම් හා රසාස්වාදය - ඉන්දියාව

**4.** භාරත කැටයම් කලාවේ විශිෂ්ඨත්වය කියාපාන නිර්මාණ රාශියක් සංචි භාරුත් අමරාවති යන ස්ථූප ආශ්‍රිතව හමුවී ඇත.

I. භාරුත් ස්තූප ගල්වැට කැටයම් සහ සාංචි ස්ථූප තොරණ කැටයම් අතර දැකගත හැකි සමානාතාවයක් සහ අසමානතාවයක් හදුන්වන්න (ලකුණු 2යි)

II. අමාරාවති කැටයම් අතර බුදුන් වහන්සේ මානව ස්වරූපයෙන් දැක්වූ අවස්ථා මෙන්ම නොදැක්වූ කැටයම් ද වේ. මේ පිළිබද කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 5 යි)

III. සාංචි භාරුත් කැටයම්වලට වැඩි නිර්මාණශිලිත්වයක් ක්‍රියාකාරිබවක් හා කලාත්මක බවක් අමරාවති කැටයම් තුළින් විද්‍යාමාන වේ. උදාහරණ සහිතව මේ පිළිබදව විමසීමක් කරන්න (ලකුණු 8 යි)

**5.** 16 -19 සියවස් අතර භාරතයේ එතෙක් පැවති කලාවන් යටපත් කරගෙන පර්සියානු ආභාෂය මත මෝගල් කලා සම්ප්‍රදාය හා ඉන් අනතුරුව රාජ්පුට් කලා සම්ප්‍රදායක් බිහි විය.

I. මෝගල් සිතුවම් වලට ශිල්පීන් තේමා කරගත් කරුණු දෙකක් සදහන් කරන්න. (ලකුණු 2යි)

II. ක්‍රි.ව 1561 දි අග්‍රා බල කොටුවෙන් පිටකදි අක්බර් රජුට මුහුණ දීමට සදුවූ ප්‍රකට ත්‍රාසජනක සිද්ධියක් අක්බර්නාම සිතුවමින් ප්‍රකාශ කෙරේ. මෙම සිදුවීම අන්තර්ගත අක්බර්නාම සිතුවම කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 5 යි)

III. මෝගල් චිත්‍ර කලාවට විෂය වූ කරුණු වලට වඩා වැඩි විෂය පථයක් රාජපුට් වරුන් සතුවිය. එය හින්දු සාහිත්‍ය පදනම් කරගත් ගීතවත් වූ අලංකාර නර්තනයක් බඳුය. මෝගල් රාජපුට් සිතුවම කලාවන්හි දැකගත හැකි සුවිශේෂිකා පිළිබඳ තුලනාත්මක ඇගයීමක් කරන්න (ලකුණු 8 යි)

**ඉ කොටස**

**චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය**

**6.** ඊජිප්තු වැසියන් තුළ වූ මරණින් මතු ජීවිතය පිළිබඳ ගූඪ විශ්වාසය ඇසුරින් ඔවුන්ගේ කලා නිර්මාණ සියල්ලම පිරමිඩ නම් වූ වාස්තු විද්‍යා අංශ ආශ්‍රිතව සිදුකර තිබේ.

I. ඊජිප්තු /මිසර පිරමිඩ ආශ්‍රිතව හමුවූ මූර්ති දෙකක් හඳුන්වන්න (ලකුණු 2යි)

II. ඊජිප්තු සොහොන් ගෙවල් වල ආරම්භය හා විකාශනයට පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 5 යි)

III. පිරමිඩ අභ්‍යන්තර බිත්ති දේවස්ථාන බිත්ති හා කුළුණු මත ඇඳි සිතුවම් මධ්‍ය රාජධානි යුගයේදි සම්ප්‍රදායික ලක්ෂණ හා ස්වභාවික ලක්ෂණ අතර සම්මිශ්‍රණයෙන් නිර්මාණය වූ සිතුවම් නිදසුන් ලෙස ගනිමින් ඊජිප්තු සිතුවම් කලාව පිළිබඳ තුලනාත්මක ඇගයීමක් කරන්න (ලකුණු 8 යි)

**7.** ස්වභාවික වාදය දියුණු වීමේ ඵලයක් ලෙස ස්වභාවික ලෝකය තාත්වික අයුරින් නිර්මාණයට චිත්‍ර ශිල්පින් නැඹුරු විය මෙය චිත්‍ර කලා මූලධර්ම වැනි උපක්‍රම දියුණුවීමට හේතු විය. එසේම කාය ව්‍යූහ ලක්ෂණ සහ පරිමාණ ලක්ෂණ අධ්‍යයනයට පෙළඹුණි.

I. පුනරුද යුගය ආරම්භයට හේතු වූ කරුණු දෙකක් නම් කරන්න (ලකුණු 2යි)

II. පුනරුද කලාවේ පුරෝගාමී චිත්‍ර ශිල්පියා මෙන්ම විශිෂ්ඨතම චිත්‍ර ශිල්පියා ලෙස දැක්වෙන ලියනාඩෝ ඩාවිංචි පිළිබඳ කෙටි විස්තරයක් කරන්න (ලකුණු 5 යි)

III. මයිකල් අන්ජලෝ විසින් සිස්ටයින් දෙව මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ අඩි 48-44 ප්‍රමාණයේ එකම තේමාවකට අනුව නිර්මාණය කළ අවසන් විනිශ්චය නම් සිතුවමේ ආකෘතිය මනාව රූප හැසිරවීම තේමාව පිළිබඳ විග්‍රහයක යෙදෙන්න (ලකුණු 8 යි

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : |
|---|---|---|

විෂයය :- ..............................................................
පාසලේ නම :- ..............................................................
ඇතුළත්වීමේ අංකය :- ..............................................................

උපදෙස්

- ඔබේ විභාග අංකය ඔබ චිත්‍ර අඳින කඩදාසියේ පසුපිටෙහි පැහැදිලිව ලියන්න
- ඔබේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත්ය
- තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකිය.

ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

---

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න

- කඩදාසියේ කලය අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න
- ද්‍රව්‍යයන්ගේ ගති ලක්ෂණ මතුපිට ස්වභාවය පරිමාණය ඇස් මට්ටම ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ සැලකිලිමත් වන්න
- ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර සහිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න
- වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න
- ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ ලැල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැලපෙන පරිදි වෙනස් කර ගැනීමට හැකිය.
- දිය සායම් පොස්ටර් සායම් කුඩු සායම් පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මධ්‍යය කිපයක් මිශ්‍රිතව හෝ භාවිත කළ හැකිය.

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
**Department of Education – North Central Province**

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : |
|---|---|---|

විෂයය :- ..........................................................................

පාසලේ නම :- ..........................................................................

ඇතුළත්වීමේ අංකය :- ..........................................................................

**විභාග ශාලාධිපතිවරුන්ට උපදෙස් මෙය විභාග ශාලාධිපතිවරුන් පමණක් භාවිතා කරන්න.**

මෙහි පසුපිට දැක්වෙන රූප සටහන ආදර්ශ කර ගනිමින් ද්‍රව්‍ය බලා ඇඳීමට සුදුසු නිශ්චල ද්‍රව්‍ය සම්පින්ඩනය පිළියෙල කරන්න.


යෝජිත ද්‍රව්‍ය -:

1. පෙට්ටියක් සුදු ඩිමයි කඩදාසියකින් ආවරණය කරන ලද 35cm x 22cm x 12 cm පමණ ප්‍රමාණය හෝ ඊට ආසන්න ප්‍රමාණයේ ඉවතලන කාඩ්බෝඩ් පෙට්ටියක්
2. කුඩා ජෝගුවක් රතු වර්ණ උස 14 පමණ වන හැඩලය සහිත ජෝගුවක්
3. පොල් ගෙඩියක් දෙකට පළන ලද පොල් බෑ 02ක්
4. කොටු සහිත වර්ණ හැප්කින් එකක් 45 45 ප්‍රමාණය
5. විදුරුවක් 10 පමණ වන විදුරුවක්
6. ක්‍රෝටන් මල් අත්තක් පත්‍ර හයකින් පමණ යුත් පළල් ක්‍රෝටන් අත්තක්
7. ධාරකය

ඉහත යෝජිත ද්‍රව්‍ය විභාගය පැවැත්වීමට පෙර දින සූදානම් කරන්න.

## චිත්‍ර කලාව II

### නිශ්චල ද්‍රව්‍ය සම්පින්ඩනය





Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : |
|---|---|---|

විෂයය :- ..........................................

පාසලේ නම :- ..........................................

ඇතුළත්වීමේ අංකය :- ..........................................

සැලකිය යුතුයි

- ඔබ අදින යුත්තේ එක චිත්‍රයක් පමණි
- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසුපිට පැහැදිලිව ලියන්න
- දිය සායම් පෝස්ටර් සායම් පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකිය.
- මොස්තර අඳින අය සඳහා ටිෂූ කඩදාසි කවකටු පෙට්ටි භාවිත කළ හැකිය

---

''අ'' කොටසින් හෝ ආ කොටසින් හෝ ඊ කොටසින් හෝ එකක් පමණක් තෝරා ගන්න

**අ කොටස -චිත්‍ර සංරචනය**

1. අධික වර්ෂාව නිසා ඇතිවූ ගංවතුරක්
2. ගම්බද තේ කඩයක්
3. උදෑසන ශරීර සුවතා කරන ළමුන්
4. වළං කරත්තයක් ගමට ඇවිත්

**ආ කොටස -මෝස්තර නිර්මාණය**

1. රෙදි පිළිමත මුද්‍රණය කිරීම සඳහා භාවිතයට ගත හැකි ව්‍යාප්ත මෝස්ත.රයක 9' x 9' ප්‍රමාණයේ කොටසක් නිර්මාණශිලි සත්ත්ව හැඩ අයුරින් නකිර්මාණය කරන්න
2. සමාන පැති 8ක් සහිත කාන්තා කුඩයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න
3. අඟල් 9පළලැති සරම් වාටියක් හෝ සාරි පල්ලුවක් සඳහා උචිත වාටි මෝස්තරයක් නිර්මාණය කරන්න

**ඉ කොටස -ග්‍රැෆික් චිත්‍ර**

1. **''ස්වයංපෝෂිත රටක් ගොඩනගමු''** යන තේමාව අර්ථ ගන්වන පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න
2. මනාලියන් හැඩ ගන්වන සැලෝනයක ප්‍රදර්ශන පුවරුවක් අඩි 5 x 8 සැලසුම් කර වර්ණ ගන්වන්න
3. **''පාරම්පරික ගැමි නාටක''** නම් පර්යේෂණ කෘතියට සුදුසු කංචුකයක් නිර්මාණය කරන්න

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න